www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නියෝජ්‍ය ඇමතිවරයෙකු ඉවත් කිරීමට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට සිදුවේ

**Sri Lankan president forced to sack deputy minister**

**නන්ද වික්‍රමසිංහ විසිනි**

**2010 අගෝස්තු 14**

කම්කරුවන්ගේ උග්‍රවන විරෝධතා මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂට නියෝජ්‍ය මහාමාර්ග ඇමති මර්වින් ද සිල්වා ඔහුගේ තනතුරෙන් ඉවත් කිරීමට පසුගිය අඟහරුවාදා සිදුවිය. පාලක සන්ධානයේ ප්‍රධාන පක්ෂය වූ රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) සිය සාමාජිකත්වය ද සිල්වාට තහනම් විය.

විරෝධතා පුපුරා ගියේ පසුගිය අගෝස්තු තුන්වෙනිදා සිල්වා මොහොමඩ් ඉෂාඩ් නමැති රාජ්‍ය නිලධාරියා ගසකට බැඳ ඔහුගේ සහකාර නිලධාරින් ඉදිරියේ ඔහුට චෝදනා කරමින් ප්‍රසිද්ධියේ අවමානයට පත් කිරීමෙන් ද එම ක්‍රියාවට විරුද්ධ වූ අය ට ද එසේම දඬුවම් කරන බවට තර්ජනය කිරීමෙන් ද පසුව ය. සිල්වා කැලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මෙසේ කරද්දී ඔහු ලඟින්ම සිට එය බලා සිටි පොලීසිය ඔහුව වැලැක්වීමට ඉදිරිපත් වූයේ නැත. සිල්වා තම ක්‍රියාවට ප්‍රසිද්ධියක් ලබා දීම සඳහා ජන මාධ්‍ය ද එහි කැඳවා තිබුනි. එහෙත් මෙම සිද්ධිය දැක ගත් මහජනයාගේ සද්කෝපය පුපුරා ගිය තතු තුල ඔහුගේ උප්පරවැට්ටිය ඔහු වෙතම කැරකී ආවේය.

ආන්ඩුවේ සමෘද්ධි ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර නිලධාරියෙකු වූ ඉෂාඩ් ට විරුද්ධව පහර එල්ල කරන ලද්දේ ඩෙංගු මර්දනය පිලිබඳව සාකච්ඡා කෙරෙන රැස්වීමකට සම්බන්ධ වීමට ඔහුට නොහැකි වීම හේතුවක් කොට ගෙන ය. ඔහුට එසේ කිරීමට නොහැකි වූයේ ඔහුගේම දරුවෙකු ද අසනීපව සිටි හෙයිනි. සිල්වා මෙසේ කවුරුන් හෝ ප්‍රසිද්ධියේ අවමානයේ පාත්‍ර කිරීමට තීන්දු කර ගත්තේ මෙම අවුරුද්දේ දිවයිනේ ඩෙංගු පැතිරී යාම අති මහත් ලෙස වැඩිවී තිබුනු තතු තුල ය. මෙම වර්ෂය තුල ජූලි මාසය වන විට හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව 23,000 දක්වා ද මරන සංඛ්‍යාව 165 දක්වා ද ඉහල නැග තිබුනි. ජනමාධ්‍ය ඉදිරියේ කරන ලද මෙම ම්ලේච්ඡ ක්‍රියාවේ කයෝර එල්ලය වූයේ මෙම සෞඛ්‍ය අර්බුදයට වගකිවයුතු වූ දශක ගනනාවක් දිග් ගැස්සුනු ආන්ඩුවේ නොතැකීම වසන් කිරීම ය.

මෑත දී ජනාධිපති රාජපක්ෂ ඩෙංගු මර්දනය ගැන කතාකරමින් "ආන්ඩුවෙන් සෑම දෙයක්ම බලාපොරොත්තු වෙනවා වෙනුවට... මහජනයා තමන්ගේ යුතුකම ඉටු කල යුතු ය"යි ප්‍රකාශ කලේය. ජනාධිපතිගේ මෙම ඇඟවුමෙන් උසිගැන්වුනු සිල්වා ඉෂාඩ්ව අවමානයට පත්කිරීම යුක්ති සහගත කලේ මෙසේ කියමිනි: "වැඩපලවල්වල විනයක් තිබිය යුතුය. ආන්ඩුව දැන් ඩෙංගු මර්දනයට හමුදාව සහ පොලීසිය මෙහෙයවා ඇත; එහෙත් අනෙක් රාජ්‍ය නිලධාරින් එයට සහාය දක්වන්නේ නැත. ඩෙංගු පැතිරී යාමට හේතුව රාජ්‍ය නිලධාරින්ගේ වරද ය."

අගෝස්තු 6 වෙනි දා දසදහස් ගනනක් සමෘද්ධි සේවකයෝ රට පුරා පෙලපාලි පවත්වමින් සිල්වාගේ ක්‍රියාවන්ට විරුද්ධත්වය දැක්වූහ. කැලනිය අසල කිරිබත්ගොඩ පිකට් එකකට තුන්දහසක් පමන කම්කරුවෝ සහභාගි වූහ. කුරුනෑගල දිස්ත්‍රික්කයේ සමෘද්ධි කාර්යාල දින දෙකක් තිස්සේ වසා තිබුනි. අගෝස්තු 9 වෙනිදා මහනුවරට එක්රැස්වූ 3,000ට අධික සමෘද්ධි සේවකයෝ සිල්වා හෙලා දුටුවාහ.

දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වල දෙමල කතාකරන සමෘද්ධි කම්කරුවන් අනෙකුත් ප්‍රදේශවල තම සිංහල සහෝදරයින් හා එක්ව එම විරෝධයට සහභාගි වීම වැදගත් අර්ථයක් දරා සිටී. උතුරු නැගෙනහිර පලාත් 2009 මැයි දක්වා දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ පැවති දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය පරාජය කෙලවරවූ භේදකාරක සිවිල් යුද්ධයෙන් විනාශභාග්ව පවතින පලාත් ය.

උතුරේ යාපනයේ සමෘද්ධි සේවකයෙක් ලෝක සමාජවාදී වෙබ් අඩවියට (ලෝසවෙඅ) මෙසේ පැවසීය. ''ඇමතිවරයා අපේ සහෝදර කම්කරුවාට එල්ල කල ප්‍රහාරය නීති විරෝධීය. ඇමතිවරයා හැසිරුනේ ම්ලේච්ඡයකු මෙනි. (යුද්ධයෙන් පසු) ප්‍රථම වතාවට සිංහල හා දෙමල සටන්කරුවන් එක්ව සටන් කිරීම ගැන අපි සතුටට පත්වෙමු.'' ඩෙංගු වසංගතය

මැඩපැවැත්වීමට නොහැකිවීම ගැන වගකිවයුත්තේ ආන්ඩුව යැයි ද ඔහු පෙන්වා දුන්නේ ය.

මෙම විරෝධතාවයෝ ආන්ඩුව විසින් ජීවන තත්වයන්ට එරෙහිව එල්ල කරනු ලැබ ඇති වඩවඩාත් උග්‍රවන ප්‍රහාරයන්ට ද මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට ද ප්‍රතිපක්ෂව වැඩෙන්නා වූ වඩාත් පලල් සතුරු බවක්ද පිලිබිඹු කරති.

සමෘද්ධි ව්‍යාපෘතිය තුල වැඩ කරන 24,000ක් සේවකයෝ පාලකයන් විසින් සුබසාධන සහනාධාර අපයෝජනයට භාජන කරන සැටි පිලිබඳව හොඳින් දැන සිටිති. පාලක සන්ධානය සොච්චම් සහනාධාර ප්‍රතිපාදන යොදාගන්නේ මෙම අංශයේ වැඩකරන වෘත්තීය සමිති ද පාවිච්චි කරමින් විශේෂයෙන්ම ගම්බද දුප්පත් ජනයාගේ කොටස් අතර බලපෑම් කිරීමේ තත්වයක් ඇති කර ගැනීමට ය.

වෘත්තීය සමිති - ආන්ඩුවේ සහ විපක්ෂයේ යන දෙකේ ම - උත්සාහ කලේ මර්වින් සිල්වාට එරෙහි විරෝධතාවයන් ඉතා පහල මට්ටමකට සීමා කිරීමට ය. සමස්ත ලංකා සමෘද්ධි කෘෂිකර්ම සහ පර්යේෂන සහකාර නිලධාරින්ගේ සංගමය (එස්ජ්ආර්ජ්ඕ) කියා සිටියේ සිල්වා ප්‍රසිද්ධියේ සමාව ලබාගත යුතුය කියා ය. විපක්ෂයේ ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) සම්බන්ධ සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ සංගමය (එස්ඩීඕයූ) ද එම ඉල්ලීම ම ඉදිරිපත් කලේය.

විරුද්ධ පක්ෂයේ පක්ෂයන් සහ මාධ්‍යයන් ද ඇතුලු වෘත්තීය සමිති තමුන්ගේ සම්පූර්න අවධානය යොමු කලේ සිල්වා දෙසට ය. සිල්වා ආන්ඩුවේ දේශපාලන විරුද්ධවාදීන්ට සහ විවේචකයන්ට එරෙහිව එල්ල කල ප්‍රහාරයන් මගින් නම කැතකර ගත්තෙකි. ඔහු 2007 දෙසැම්බරයේ දී ජාතික රූපවාහිනී කාර්යාල පරිශ්‍රයට ඇතුල්ව තමන්ගේ කථාවක් විකාශනය නොකිරීම ගැන පුවත් අධ්‍යක්ෂක වරයෙකුට පහර දුන්නේ ය. එහිදී සේවකයන් විසින් හිරකරගනු ලැබූ සිල්වා නිදහස් කිරීමට හමුදාව යැවීමට ආන්ඩුවට සිදුවිය.

ගතවූ අවුරුද්දේ ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරන වලදී විරුද්ධ පාක්ෂික උද්ඝෝෂකයන්ට එරෙහිව මැරවර බලය පාවිච්චි කිරීම ගැන සිල්වාට එරෙහි චෝදනා නිරන්තරව ඉදිරිපත් විය. ජනමාධ්‍යවේදීන්ට එරෙහිව ද සිල්වා සහ ඔහුගේ සහකරුවෝ නිරන්තර තර්ජන හා ප්‍රහාර එල්ල කලෝය. සිල්වා තම වැඩපිලිවෙල ගැන යම් විවේචනාත්මක ප්‍රචාරයන් කල සිරස රූපවාහිනී ජාලය විශේෂයෙන්ම ඉලක්ක කර ගත්තේ ය.

කෙසේ වෙතත් ඔහුගේ මැරවර වැඩ ක්‍රමය වනාහී සමස්තයක් වශයෙන් රාජපක්ෂ පාලන තන්ත්‍රයේ අත්තනෝමතික ස්වභාවයේ එක් ලක්ෂනයක් පමනි. ගතවූ අවුරුදු 5 ඇතුලත ජනමාධ්‍යවේදීන් ද දේශපාලකයන් ද විවේචකයන් ද ඇතුලු සියගනනක් ජනයා ආරක්ෂක හමුදාවන්ගේ සෘජු අධිකාරය යටතේ නැතිනම් අනුදැනුම යටතේ ක්‍රියාත්මක වූ ආන්ඩු ගැති මිනීමරු කන්ඩායම් විසින් පැහැරගෙන යෑම හෝ මරාදැමීම සිදු කරන ලදී. මෙම අපරාධයන් වැඩිහරියක් පිලිබඳව කිසිදු වැරදිකරුවකු දඬුවමට පත් කිරීම පසෙක තිබියේවා අත් අඩංගුවට ගැනීම වත් කර නැත.

තමා කලාට වඩා බෙහෙවින් දරුනු අපරාධ කොට ද වෙනත් අය ගැලවී ගත් තතු තුල තමාට ද එසේ කල හැකි යයි සිල්වා සිතන්නට ඇත. ව්‍යවස්ථාව විවෘතවම උල්ලංඝනය කොට රටේ ඉහලම උසාවිය විසින් ගන්නා ලද තීන්දු නොතකා හැරීම ජනාධිපති රාජපක්ෂ විසින්ම සිදු කර තිබේ. යුද හමුදාව යුද්ධයේ අවසාන මාස කීපය තුල දී දසදහස්ගනන් දෙමල සිවිල් ජනයා කාලතුවක්කු හා ගුවන් ප්‍රහාර වලට ගොදුරු කලේ ය. එහෙත් මෙය පිලිබඳව කවරෙකු හෝ වගකිව යුතු යයි තීන්දු කොට නැත. - ආන්ඩුව සරලවම කියා සිටින්නේ හමුදාව කිසිදු සිවිල් මරනයකට වගකිවයුතු නැතැයි කියාය.

ජනාධිපති රාජපක්ෂ සතියක්ම ගතවන තුරු සිල්වාට විරුද්ධව කිසිදු පියවරක් ගත්තේ නැත. විරෝධතාවන් කෙමෙන් ඇල්මැරී යනු ඇතැයි ඔහු පැහැදිලිවම බලාපොරොත්තු විය. අන්තිමේදී රාජපක්ෂට සිල්වා ඉවත්කිරීමට සිදුවීමෙන් පෙන්නුම් කරන්නේ ඔහුගේ ආන්ඩු හවුල කොතරම් බිඳෙනසුලුද යන්න ය.

ඊයේ ඩේලි මිරර් කතුවැකිය මෙසේ සඳහන් කලේ යː ''ඔහුගේ කයෝර ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ මගින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රමිතීන් පහත හෙලීමට මර්වින් සිල්වා ට අවුරුදු ගනනක් තිස්සේ ඉඩ සලසා දෙන ලදී. බොහෝ කලකට පෙර කර යුතුව තිබුනු නිවැරදි කිරීමක් දැන් සිදු කර ඇත; එය කර ඇත්තේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි සිල්වාගේ ක්‍රියාවල බලපෑම තේරුම්ගැනීම නිසා නොවේ, ඔහුගේ ක්‍රියාව පාලක එක්සත් ජනතා නිදහස් සංධානයේ පැවැත්මට තර්ජනයක් වූ නිසා ය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පක්ෂපාත වෘත්තීය සමිතියේ (එස්ජ්ආර්ජ්ඕ) සභාපති එස්ජ්ඩී ජගත් කුමාර, සිල්වා ඉවත් කිරීමට ජනාධිපතිවරයා ගත් තීන්දුව හුවාදැක්වීම පුදුමයට කරුනක් නොවේ. ඔහු කියන්නේ ''කුමන පුද්ගලයෙකු වුව ද, නීතිය තමන්ගේ අතට ගත්හොත් ජනාධිපති රාජපක්ෂ එයට එරෙහිව ක්‍රියා කරන බවය.

ආන්ඩුව ''මහජනයාගේ බලයට'' නැමී ඇතැයි යන මිත්‍යාවට ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක ද පෝර දැමුවේය. ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක නියෝජ්‍ය ඇමතිවරයා ඉවත් කිරීම තුලින් පෙන්නුම් කර ඇත්තේ ආන්ඩුවට තම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවන් දිගුකලක් පවත්වා ගෙන යාමට නොහැකි බව යයි දිසානායක කියා සිටියේ ය.

ඇත්ත වසයෙන්ම පවතින්නේ මීට මුලුමනින්ම ප්‍රතිවිරුද්ධ තත්වයකි. ආන්ඩුව මෙම සිද්ධියෙන් ගනු ඇති නිගමනය වන්නේ කම්කරු පන්තිය තුලින් පැන නගිමින් පවතින්නාවූ කුමන හෝ දේශපාලන විරුද්ධත්වයක් මැඩලීම සඳහා තම සැලසුම් දෙගුන තෙගුන කල යතු බවය. කම්කරු පන්තිය තුලින් ආන්ඩුවට එරෙහිව පැනනගින්නා වූ කුමන දේශපාලන ව්‍යාපාරයක් වුව ද වලක්වා ලීමට තමන්ගේ ඇති සූදානම තවත් වරක් පෙන්නුම් කර ඇති වෘත්තීය සමිතිවල සහයෝගය තමන්ට ලබාගත හැකි බව ආන්ඩුව හොඳින් දනී.

ගැඹුරු ආර්ථික අර්බුදයකට මුහුන දී සිටින රාජපක්ෂ ආන්ඩුව මේ වන විටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කර ඇති උග්‍ර කප්පාදු වැඩපිලිවෙල ක්‍රියාත්මක කරමින් සිටී. මෙම තතු තුල කම්කරුවන්ට තම ජීවන තත්වයන් ද මූලික අයිතීන් ද ආරක්ෂා කර ගත හැක්කේ වෘත්තීය සමිතිවලට ද පාලක පන්තියේ සියලු කන්ඩායම්වලට ද විරුද්ධව සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගයක් මත බලමුලුගැන්වීගැනීම තුලින්ම පමනි.

© www.wsws.org